දෙපාර්තමේන්තු නියෝග 09/ 2017

මගේ අංක : පා/1/2/5/2
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.10.26

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ප්‍රධාන කෘෂි විශේෂඥ / ප්‍රධාන කෘෂි විද්‍යාඥ,
අතිරේක අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

**<u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළුම චක්‍රලේඛ නිකුත් කිරීම සම්බන්ධ කටයුතු වල වගකීම පාලන අංශයට පැවරීම.</u>**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන තීරණ සම්බන්ධයෙන් දැනුවත් කර, ඒ අනුව සියළුම ආයතන, අංශ සහ ඒකකයන් ක්‍රියාත්මක කිරීම සඳහා, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු නියෝග සහ පරිපාලන නියෝග නිකුත් කිරීම, පාලන අංශයේ මානව සම්පත් කළමනාකරණ සහ ප්‍රතිපත්ති ශාඛාව මඟින් සිදු කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක තාක්ෂණික ව්‍යාපෘති / වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම හා තාක්ෂණික උපදෙස් ලබා දීමේ අරමුණින්, තාක්ෂණික චක්‍රලේඛ නිකුත් කිරීම ද, දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ පාලන 01 ( මානව සම්පත් කළමනාකරණ සහ ප්‍රතිපත්ති) ශාඛාව මඟින්ම සිදු කරනු ලැබේ.

02. තාක්ෂණික අධ්‍යක්ෂ අංශ 10ක් සහ පරිපාලන, ඉංජිනේරු සහ මුදල් යන අංශ වලින් සැදුම්ලත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මඟින් කවදුරටත් තම අංශ වලට අදාළ හෝ අදාළ නොවන කරුණු සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කිරීමෙන්, චක්‍රලේඛයක ඇති වටිනාකම සහ අවධාරණය කිරීමේ ශක්තිය සහ එම චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාත්මක වීම දුර්වල වන අතර, චක්‍රලේඛ නිකුත් කිරීම වඩා විධිමත්ව සිදු විය යුතුව පවතී. මින් ඉදිරියට දෙපාර්තමේන්තුවේ සියළුම චක්‍රලේඛ පාලන අංශයේ පාලන 01 (මානව සම්පත් කළමනාකරණ සහ ප්‍රතිපත්ති ශාඛාව ) මඟින් පමණක් නිකුත් කරනු ලබන බව කාරුණිකව දන්වමි.

03. යම් කරුණකට හෝ කරුණු වලට අදාලව යම්කිසි අංශයක් මඟින් චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතු වේ නම්, එයට මුල් වන විෂයට අදාල අංශය මඟින් චක්‍රලේඛය කෙටුම්පත් කර, මාගේ විධිමත් අනුමැතිය සහිතව නිකුත් කිරීම සඳහා පාලන අංශයේ පාලන 01 (මානව සම්පත් කළමනාකරණ සහ ප්‍රතිපත්ති) ශාඛාව වෙත භාර දිය යුතු ය. ඒ සමඟ, අනුමත චක්‍රලේඛ කෙටුම්පතේ මෘදු පිටපතක් ද අනිවාර්යයෙන්ම භාර දිය යුතු අතර, පරිගණක ගත කිරීමේ දී යුනිකෝඩ් මෘදුකාංගය (Iskoolapota) පමණක් භාවිතා කළ යුතු ය.

04. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී, ඉදිරියේදී නිකුත් කරනු ලබන සියළුම දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ / නියෝග ඉංග්‍රීසි පරිවර්තනයක් ද සහිතව සිංහල හා දෙමළ භාෂා වලින් පළ කළ යුතු බැවින්, යම් අංශයක් මඟින් චක්‍රලේඛ කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේදී, හැකි සෑම අවස්ථාවකම දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනයක් ද සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

05. අංශ භාර අධ්‍යක්ෂවරුන් මඟින්, සියළු චක්‍රලේඛ සියළුම ඒකක වෙත යොමු කරනු ලබන අතර, යම් චක්‍රලේඛයක් සම්බන්ධව ගැටළු පවතී නම්, ඒ පිළිබඳව පාලන 01 (මානව සම්පත් කළමනාකරණ සහ ප්‍රතිපත්ති) ශාඛාව වෙත දැනුම් දිය හැකි ය.

06. නිකුත් කරනු ලබන චක්‍රලේඛ, දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.agridept.gov.lk) පළ කරනු ලබන අතර, වර්ෂය තුළ නිකුත් කරන ලද සියළුම චක්‍රලේඛ වල සාරාංශගත නාම ලේඛණයක් ද වර්ෂය අවසානයේ දී, එහි පළ කරනු ලැබේ.

07. මෙම චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව නිකුත් කරනු ලබන කිසිදු චක්‍රලේඛයක වලංගුභාවයක් නොමැති සේ සලකනු ලබන බව අවධාරණය කරන අතර, මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට සහ ලබා ගැනීමට දායක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය, ආර්.ආර්.ඒ. විජේකෝන්.
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:

01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම පිණිස.
02. විගණකාධිපති - එම